# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2307/40 - 2022 නොවැම්බර් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2022.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල වන මම, එකී මණ්ඩලයට, මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ අකුරණ ගබඩා ජලාශය හා පොම්පාගාරයේ සිට දිප්පිටිය පොම්පාගාරය දක්වා දිවෙන සම්ප්‍රේෂණ නල මාර්ග සඳහා ඉඩම් කොටස් වල පරවශතා අයිතිය අත්කර ගැනීම සඳහා, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටස්වල පරවශතා අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

ආචාර්ය **කෙහෙළිය රඹුක්වැල්ල**,
ජල සම්පාදන අමාත්‍ය.

2022 නොවැම්බර් මස 21 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 568 මෙල්වේන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මෙල්වේන ගමේ පිහිටි "තලහේන" නමැති ඉඩමෙන් සහ අංක 586 දිප්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දිප්පිටිය ගමේ පිහිටි "ඉඹුලේතැන්න" නමැති ඉඩමෙන්, පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 11.86 ක් පමණ වන ඉඩම් කොටස් දෙක:


මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**කැබලි අංක** : **01**
ඉඩමේ නම : තලහේන
ප්‍රමාණය : පර්චස් 8.3

මායිම් ;

උතුරට : එච්. එම්. එම්. මන්සිල් හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ;
නැගෙනහිරට : එච්. එම්. එම්. මන්සිල් හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ;
දකුණට : සහීරාදෙණිය සිට දිප්පිටිය දක්වා දිවෙන ප්‍රාදේශීය සභා මාර්ගය ;
බටහිරට : එච්. එම්. එම්. මන්සිල් හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස.

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් :

1. එච්. එම්. එම්. මන්සිල් මහතා,
අංක 568/3,
නීරැල්ල,
අකුරණ.

**කැබලි අංක** : **02**
ඉඩමේ නම : ඉඹුලේතැන්න
ප්‍රමාණය : පර්චස් 3.56

මායිම් ;

උතුරට : අලවතුගොඩ දිප්පිටිය මාර්ගයේ සිට නිවාස දක්වා දිවෙන පොදු මාර්ගය හා දිප්පිටිය පොම්පාගාරය පිහිටි ඉඩම ;
නැගෙනහිරට : ඩී. ජී. පියසේන හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ;
දකුණට : එච්. එම්. එම්. මන්සිල් හිමිකම් කියන ඉඩම ;
බටහිරට : අලවතුගොඩ දිප්පිටිය මාර්ගයේ සිට නිවාස දක්වා දිවෙන පොදු මාර්ගය.

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් :

1. ඩී. ජී. පියසේන මහතා,
අංක 600,
දිප්පිටිය,
අලවතුගොඩ.

EOG 11 - 0283

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.